ඉඩම් මැනුම් සභාව - 2019
-----------------------------

**1.1** විගණන මතය
--------------

ඉඩම් මැනුම් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම
-------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම
-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායි ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2002 ඔක්තෝබර් 04 දිනැති අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 43(1) හා (2) වගන්ති | සභාව විසින් සෑම වර්ෂයකම මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර සියලුම ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පලකරනු ලැබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ සංඛ්‍යාව 1041 ක්ව තිබියදී 2019 මාර්තු 29 දිනැති අංක 2117 දරන ගැසට් පත්‍රයේ බලපත්‍රලත් මිනින්දෝරුවරු 858 දෙනෙකුගේ නම් පමණක් පල කර තිබුණි. | ගැසට්පත්‍රයට යවන අවස්ථාව වනවිට බලපත්‍ර නිකුත් කරන ලද මිනින්දෝරුවරුන්ගේ සංඛ්‍යාව 858 ක් වීමට හේතුවූයේ ඒ වන විට අඩු පාඩු වලින් තොරව ලැබී තිබුණ අයදුම්පත් ප්‍රමාණය එම සංඛ්‍යාව වීමය. | පනත අනුව වාර්ෂිකව ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන් ගේ නම් ගැසට් පත්‍රයේ පලකල යුතුය. |
| (ආ) | 2018 මාර්තු 26 දිනැති 221 වෙනි සභා රැස්වීම් තීරණය. | සභාවේ ලියාපදිංචි නොවී මැනුම් කටයුතු සිදුකරන සුදුසුකම් නොලත් පුද්ගලයින් සම්බන්ධයෙන් සොයා බැලීමට පොලිස්පතිවරයා දැනුවත් කිරීමට තීරණය කර තිබුණ ද එම තීරණය අනුව කටයුතු කර නොතිබුණි. | දිනමිණ, තිනකරන් සහ ඩේලිමිරර් යන පුවත්පත් වල දැන්වීම් පල කර ඇති අතර, මෙම දැන්වීමේ පිටපත් සභාව සතුව නොමැත. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොවීමට වගබලා ගනියි. | සභාව, මැනුම් කටයුතු සිදුකරන ලියාපදිංචි නොවූ පුද්ගලයින් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,188,879 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.751,184 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,940,063 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට බලපත්‍ර ගාස්තු, ලියාපදිංචි ගාස්තු සහ වැඩමුළු ආදායම රු.1,172,274 කින් ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2019 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් 1:0.5 ක් හා 1:0.2 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාතය පහළ මට්ටමක පැවතුණු අතර, මේ සඳහා ඉදිරි වර්ෂයන් සඳහා ලැබුණු රු. 5,748,520 ක බලපත්‍ර සහ ලියාපදිංචි ගාස්තු ආදායම් ජංගම වගකීම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවක් වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුරප්පාඩුව පවතින ලේකම් තනතුරට නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන ලෙසට 2012 ජූලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණද එම තනතුර පිරවීමට 2020 දෙසැම්බර් 31 දක්වාම කටයුතු කර නොතිබුණි. | 2017.11.29 දින සම්මුඛ පරීක්ෂණයකින් බඳවාගත් නිලධාරිණිය පසුව පත්වීම භාර ගැනීමෙන් වැලකී සිටි අතර මේ සම්බන්ධව ඉදිරියේදී නැවත මැනුම් සභාව වෙත කරුණු ඉදිරිපත් කර බඳවා ගැනීමේ කොන්දේසි පිළිබඳව සාකච්ඡා කර සභාවේ ලේකම් තනතුර සඳහා සුදුසු නිලධාරියකු පත්කර ගැනීමට කටයුතු කරමි. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග පිළිපැදිය යුතු අතර, සභාවේ කටයුතු පවත්වා ගැනීම සඳහා අවශ්‍ය නිලධාරීන් හා සේවකයන් බඳවාගත යුතුය. |
| (ආ) | පැමිණිලි විසඳීමේ හා ලිපිගොනු යාවත්කාලීන කිරීමේ කටයුතු, ගිණුම්කරණ කටයුතු සහ මහජන සම්බන්ධතා පවත්වා ගැනීමේ කටයුතු සඳහා හැකි ඉක්මණින් කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකු බඳවාගතයුතු බවට 239 වෙනි සභා රැස්වීමේදී තීරණය කර තිබුනද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අදාළ තනතුරු අනුමත කරවාගෙන 2020 දෙසැම්බර් 31 දින වන තෙක් අදාළ බඳවා ගැනීම් සිදුකර නොතිබුණු බැවින්, මෙම රාජකාරී කටයුතු වලට බාධා එල්ලවී තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කාර්යමණ්ඩල බඳවා ගැනීමට මෙතෙක් අනුමැතිය ලබා දී නොමැත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් තනතුරු අනුමත කරවාගෙන අදාළ නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2017 හා 2018 වර්ෂ සඳහා කාර්යසාධන වාර්තා 2020 දෙසැම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි. | මේ වන විට සැකසුම් කොට ඇති අතර, කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අයවැය ලේඛනයේ ලී බඩු සහ කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම, පුහුණු දීමනා සහ පුහුණු වියදම් වශයෙන් එකතුව රු.495,000 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද යථෝක්ත වියදම් දරා නොතිබුණු අතර ලියාපදිංචි ගාස්තු ආදායම් හා විමර්ශන ආදායම් යන ආදායම් ප්‍රභවයන්වල අයවැයගත ආදායම් සහ සත්‍ය ආදායම් අතර වෙනස සියයට 167 සිට සියයට 200 දක්වා පරාසයක පැවතුණි. | 2019 වර්ෂයේදී රු.126,500 ක ඡායාපිටපත් යන්ත්‍රයක් හා රු.5,955 වටිනා wifi router 1 ක් මිලදී ගෙන ඇත. පුහුණු දීමනා හා පුහුණු වියදම් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය කිසිදු පාඨමාලාවකට සහභාගී වී නැත. වර්ෂය තුල බලපත්‍ර හා ලියාපදිංචි ගාස්තු සංශෝධනයකට ලක් කර ඇති අතර එය අයවැය ලේඛනය පිළියෙළ කිරීමේදී සැලකිල්ලට ගෙන නැත. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ලෙස අයවැය ලේඛනය සකස් කළ යුතුය. |
| (ඉ) | සභාව විසින් ලේඛන හෝ පොත්පත් යනාදිය විධිමත්ව පවත්වා නොතිබීම හේතුවෙන් ආදායම් ප්‍රභවය නිශ්චිතව හඳුනාගත නොහැකිව තිබුණු රු. 338,225 ක ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ ආදායම් පෙර ලැබීම් (Income Received in Advanced) යනුවෙන් දක්වා ඇති ශේෂයට එකතුකර තිබුණි. | පූර්ව වර්ෂවලට අදාළව ප්‍රභවය නිශ්චිතව සොයා ගත නොහැකි වූ රු.290,245ක් පමණක් සමුච්චිත අරමුදලට බැර කර ඇත. | ශේෂය නිශ්චිතව හඳුනාගෙන නිසි පරිදි ගිණුම්ගත කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මිනින්දෝරුවරුන්ගේ වෘත්තිය විෂමාචාර පිළිබඳව මහජනතාවගෙන් ලැබී, විසඳීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 103 ක් වුවද, වර්ෂය තුළ විසඳා තිබුණේ පැමිණිලි 54 ක් හෙවත් සියයට 52 ක ප්‍රමාණයක් පමණි. සෑම වර්ෂයක් පාසාම විසඳීමට තිබෙන පැමිණිලි සංඛ්‍යාව වැඩිවන අතර, පැමිණිලි විසඳීමේ කාර්යභාරයන් කාර්යක්ෂම කිරීම සඳහා සභාව | ඉඩම් මැනුම් සභාව වෙත ලැබෙන පැමිණිලි සංඛ්‍යාව දිනෙන් දින වැඩිවෙමින් පවතියි. තවද පැමිණිලි විභාග කිරීමේ දී අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීමට පැමිණිලිකරුවනට සහ වගඋත්තරකරුවනට සභාව | ලැබෙන පැමිණිලි කඩිනමින් විසඳීමට කටයුතු කළ යුතු වීම. |

විසින් සමාලෝචිත වර්ෂයේදී ද විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

විසින් ලිඛිතව දැනුම් දුන්නද ඒවා කලට වේලාවට ඉදිරිපත් නොකිරීම නිසා සමහර පැමිණිලි ප්‍රමාද වේ. කාර්ය මණ්ඩලයේ ඌනතාවය නිසා සිදුවන වාර්තා සැකසීමේ ප්‍රමාදයද මේ සඳහා හේතුවී තිබුණි.